www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# මහා ව්‍යසනයේ අවතාරය යලිත් සක්මන් කරයි

## The specter of catastrophe returns

**2010 මැයි 17**

2010 ලෝකය තීරනාත්මක අංශවලින් ගතහොත් ගතවූ ශතවර්ෂයේ ලෝක යුද්ධයන් ආසන්නයේ දී පැවති තත්වයන්ට සමාන තත්වයක් දරා සිටී. ආර්ථික අර්බුදය, භූ දේශපාලනාත්මක ඝට්ටන සහ සමාජ අස්ථාවරත්වය 1945 ට පසු කවර අවස්ථාවකටත් වඩා අද දින උග්‍රව පවතී. (2010 ජනවාරි සමාජවාදී සමානතා පක්ෂයේ ඉදිරි දර්ශන හා කර්තව්‍යයෝ" බලන්න)

2010 මැයි 15 දින යුරෝපීය මහ බැංකු සභාපති ජීං-ක්ලෝඩ් ට්‍රිෂේ ඩර් ස්පයිගල් පුවත්පතට මෙසේ පැවසීය: "පසුගිය දෙවන ලෝක මහා යුද්ධයෙන් පසුව ඇතිවූ අතිශයින්ම දුෂ්කර තත්වයන් ට අපි දැන් මුහුන දී සිටිමු. මේවා නම් සැබැවින් ම අතිශයින්ම කම්පාකාරී වෙනස්කම් පැන නගින අවස්ථාවන් ය."

2010 මැයි 7 සිකුරාදා සන්ධ්‍යාව ගෙවෙමින් පවතිද්දී යුරෝ මුදල් කලාපයේ සාමාජික රටවල් 16ක නායකයන්ගේ රැස්වීමක් තුල අත්‍ය'සමාන්‍ය සිද්ධියක් දැකගත හැකි විය. බිඳවැටෙමින් පවත්නා ග්‍රීසියට මුදල් ඇප දී බේරා ගැනීමේ කොන්දේසි පිලිබඳව ප්‍රන්සය හා ජර්මනිය අතර දරුනු ඝට්ටනයක් පැනනැගුනි. ඇමරිකානු ජනාධිපති ඔබාමාගේ සහාය ලැබූ ප්‍රන්ස ජනාධිපති නිකොලස් සාර්කෝසි මෙහිදී කියා සිටියේ යුරෝ මුදලට මුක්කුදීම සඳහා යුරෝ බිලියන 750ක ඇපයක් යුරෝපීය සංගමය විසින් සම්පාදනය කල යුතුව ඇතැයි යන්නය. එහෙත් ජර්මන් අගමැති ඇන්ජලා මර්කල් මෙම ඉල්ලීමට දිගින් දිගට ම සැහැසි ලෙස විරුද්ධ වූවාය.

රාත්‍රී 11.30 සහ 12 අතර එක් මොහොතක දී හිටිගමන් රැස්වීම පුපුරා ගියේ ය. නිරීක්ෂකයන් වාර්තා කර ඇති පරිදි සාර්කෝසි කෝපයෙන් මේසයට මිටින් තඩිබා "කැමොර ගසන්නට" පටන් ගති. ජර්මනිය තම විරුද්ධත්වය ඉවත් කර ගත යුතු යයි බලකරමින් ඔහු මෙසේ කීය: "මර්කල් මෙයට විරුද්ධනම් ප්‍රන්ස ජර්මන් රාජ්‍ය සම්බන්ධතා දිගුකාලීනව බිඳවැටෙනු නියතය." ඔබාමා පාලනාධිකාරයේ සහාය ඇතිව කරන ලද මෙම තර්ජනය ඉදිරියේ පසුබෑ මර්කල් ආරක්ෂක ඇප මුදල පිහිටුවීමට එකඟවූවා ය. ප්‍රධාන යුරෝපීය බලවතුන් දෙදෙනා අතර මුහුනට මුහනලා මෙම ඝට්ටනය සිදුවූයේ දෙවන ලෝක මහා යුද්ධය යුරෝපය තුල අවසන්ව 65 වසරක් ගතවීම ට ඔන්නමෙන්න කියා තිබුනු මොහොතක ය.

ධනවාදයේ දිගහැරෙන ගෝලීය අර්බුදයට (යුරෝ ඇප මුදල මගින් ඉදිරිපත් කරන ලද) ඉහත කී අලුත්ම "විසඳුම" වෙලඳපලවල උද්දාමයක් ක්ෂනිකව ඇති කලේය. ග්‍රීසියේ, ස්පාඤ්ඤයේ, රුමේනියාවේ, පෘතුගාලයේ සහ තවත් යුරෝපීය රටවල ආන්ඩු යුරෝපීය මහ බැංකුව (ඊසීබී) විසින් නියමිත දරුනු කප්පාදු සිදු කරන බවට කරන ලද සපථය මහා මූල්‍ය ජාවාරම්කරුවන්ගේ උත්කර්ෂයට හේතු විය. ටෝරි හා ලිබරල් යන දෙපක්ෂය බ්‍රිතාන්‍යයේ අයවැය හිඟය පියවීමට මහා කප්පාදු වැඩපිලිවෙලක් ක්‍රියාත්මක කිරීමට එකඟ වීම උඩ හවුල් ආන්ඩුවක් පිහිටුවීමට තීන්දු කිරීම ද ඉහත කී වෙලඳපල උත්කර්ෂයට තවත් හේතුවක් විය. කෙසේ වෙතත් සාර්කෝසි මර්කල් ගෙන් බලෙන් ගත් එකඟතාවය අර්බුදයට යටින් පවත්නා මොනම ගැටලුවක්වත් විසඳනු නැති බව පමනක් නොව තත්වය තව දුරටත් නරක් කරනු ඇති බව සතිය ගෙවීයත්ම පැහැදිලිවීමත් සමග ජාවාරම්කරුවන්ගේ උද්දාමය වාෂ්පවී ගියේ ය.

යුරෝපීය මහ බැංකුවේ මුදල් ඇපය සඳහා අරමුදල් සම්පාදනය කිරීමට දරුනු කප්පාදු පිලිවෙත් ක්‍රියාත්මක වූ කල්හි එම පිලිවෙත්වලට ගොදුරු වූ රටවල පරිභෝගය දරුනු ලෙස කප්පාදුවී ඒ රටවල් අවපාතයට ඇද දමනු ඇතැයි යන වැටහීම ප්‍රථමයෙන්ම ඊට තුඩුදුන්නේ ය. එවන් තත්වයක් විශේෂයෙන්ම ජර්මනිය වැනි යුරෝපය පදනම් කරගත් රටවල නිෂ්පාදකයන්ට වැදගත් වෙලඳපලවල් නැති කර දමනු ඇත. එයින් මෙවන් කප්පාදුවලින් සිදුවනු ඇත්තේ 2008 දී ඇරඹුනු අවපාතය තව දුරටත් ගැඹුරු වී යාමය. දෙවනුව යුරෝ බිලියන 750 ආරක්ෂක ඇපමුදලක් පිහිටුවීම ගැන යුරෝපීය මහ බලවතුන් අතර ඇතිවූ ඝට්ටනය යුරෝ මුදල (යුරෝපයේ තනි මුදල් ඒකකය) තව දුරටත් පවත්වාගෙන යාහැකිද යන්න පිලිබඳ විශ්වාසය - 1999 දී එම ව්‍යාපෘතිය අරඹා අවුරුදු 10ක් ගතවී වැඩි කලක් යාමට පෙර - අතර බරපතල ලෙස පලුදු කර තිබුනි. මැයි 7 දා ජර්මන් අගමැති මර්කල් ප්‍රන්ස - ඇමරිකානු තර්ජනය ඉදිරියේ අඩියක් පස්සට ගත් නමුත් දැන් ඈ යුරෝ මුදල අතහැර තනි ජර්මන් මුදලකට පැනගැනීම සඳහා ඩොයිෂ්මාර්ක් නෝට්ටු

මුද්‍රනය කරමින් සිටින බවට බ්‍රිතාන්‍ය ගාඩියන් පුවත්පතේ වාර්තා වීමත් සමග වෙළඳපල පුරා දූෂමාන ආරංචි පැතිරෙමින් පවතී. යුරෝ කලාපය බිඳවැටීම සලකුනු කරන්නේ හුදෙක් යුරෝ මුදලේ අවසානය පමනක් නොවේ. එය වනාහී යුරෝපීය රාජ්‍ය අතර දේශපාලන සබඳතා බිඳවැටීම් විසින් විනාශකාරී හා ලේවැකි ගැටුම් ඇති කිරීමේ තර්ජනයක් උත්ගත කරන තත්වයකි. මැයි 15 දා සුඩෙටන් ෂීටුං පුවත්පත උද්ගතවිය හැක්කේ කෙවන් තත්වයක් ද යන්න මෙසේ විස්තර කලේය: "යුරෝපීය සංගමය එකට බැඳ තබන වැදගත්ම හුයපට වූ පොදු යුරෝ මුදල බිඳවැටෙත්ම, යුරෝපීය සංගමය ම බිඳී විසිරී යනු ඇත. ජාතික රාජ්‍ය 27ක් යලිත් වෙළඳපලවල් සඳහා කාවැටෙන්නට පටන් ගනිති. ප්‍රධාන රට ද වඩාත් සෞඛ්‍ය සම්පන්න කාර්මික විනයක් පවත්නා රට ද වන ජර්මනියට සතුරන් බෝවනු ඇත. බොහෝ විට සෙසු රටවල් විසින් ජර්මනිය වර්ජනය කිරීම ද ඇරඹෙනු ඇත. යුරෝපය මත තනි බලය පිහිටුවා ගැනීමට උත්සාහ කරන (ජර්මන්) මහ බලවතා පිලිබඳ බිය සැක යලිත් පැතිරෙනු ඇත." දැන් පවත්නා දේශපාලන හා ආර්ථික තත්වය වනාහී 1939-45 අතර දෙවන ලෝක යුද්ධය පමනක් නොව 1914-18 පලමුවන ලෝක යුද්ධය පැනනැගුනු සමයට පසු පැනනැගී ඇති දරුනුම තත්වය යයි යුරෝපා මහ බැංකුවේ සභාපති ට්‍රිෂේ අනතුරු අඟවන්නේ මෙම සන්දර්භය තුලය.

ට්‍රිෂේ මහතා වැනි ජාත්‍යන්තර මූල්‍ය කටයුතු තුල ප්‍රමුඛ වගකීමක් දරා සිටින කෙනෙක් තමාගේ වචන තෝරා ගන්නේ ඉතා පරෙස්සමින්ය යන්න කිවයුතු නැත. යුරෝපයේ ඉතා පෘථුලව කියවනු ලබන සඟරාවක් වන ඩර් ස්පයිගල් හි වාර්තාකරුවකුට කතාකරන ට්‍රිෂේ වත්මන් අර්බුදය වනාහී ගතවූ 20 වන ශතවර්ෂයේ සිදුවූ ප්‍රධාන ලෝක පරිමාන මහා ව්‍යසනයන් දෙකට සමාන වන්නා වූ විනාශයක් යයි කියා සිටී.

ට්‍රිෂේ කරන්නේ අතිශයෝක්තියක් නොවේ. ඔහු යුරෝපා ඉතිහාසය මැනවින් දනී. පලමුවන ලෝක යුද්ධයේ පුපුරායාම වනාහී කලින් සාමකාමී දශක හතරක් තිස්සේ ප්‍රධාන යුරෝපීය ධනේශ්වර රටවල් අතර ඒකරාශීවූ යටපත්කල නොහැකි දේශපාලන ආර්ථික ඝට්ටනයන් හි විපාකයක් විය. මිලියන 50ක් ජනයා මරනයට පත්කල 1917-18 යුගය අවසන්වූයේ එම යුද්ධයට හේතු වූ ගැටලු විසඳ නොවේ. ඒ වෙනුවට ඇත්ත වශයෙන්ම සිදු වූයේ නොවිසඳුනු ප්‍රතිසතිතා පැසවා ඔඩුදුවා 1929 මහා අවපාතයේ ආර්ථික ව්‍යසනයට මග පාදා, ෆැසිස්ට් ඒකාධිපතිත්වයන්ට දොර හැරදී අන්තිමේදී 1939 දෙවන ලෝක යුද්ධයේ මහා ව්‍යසනය කඩා පාත් කිරීමය. එම යුද්ධයේ මිලේච්ඡත්වයේ අවුරුදු 6 ඇතුලත මිලියන 80ක් මනුෂ්‍යයෝ මරා දමන ලදහ. යුරෝපීය පාලක පන්තිය ඇමරිකා එක්සත් ජනපදයේ නායකත්වය යටතේ දෙවන ලෝක යුද්ධයෙන් ඉක්බිති දශකවල දී තවත් එවන් මහා ව්‍යසනයක් යලි ඇති වීමට ඉඩ නොතබන ආකාර ආර්ථික හා දේශපාලන සංස්ථා පිහිටුවාලීමට ප්‍රයත්නයක් දැරීය. විශේෂයෙන්ම - 1870-1945 අතර එකිනෙකා සමග තුන් වතාවක් යුද්ධ කරගෙන තිබූ ජර්මනිය හා ප්‍රන්සය අතර "සාමය" පිහිටුවා එම දෙරට සංකීර්න ඒකාග්‍ර ආර්ථික සම්බන්ධතා ජාලයකින් එකට බැඳලීම එහි වැදගත් කොටසක් ඉටු කලේ ය. යුරෝපීය සංගමය පිහිටුවා ලීම ද අන් සියල්ලටමත් වඩා පොදු මුදලක් (යුරෝව) පිහිටුවා ලීම ද යුරෝපීය ස්ථාවරත්වය පිහිටුවා ලීමේ පශ්චාත් යුදකාල ප්‍රයත්නයේ උච්ච අවස්ථාව විය. එහෙත් මෙය සිදුවූයේ පරස්වාචකවය. 1999 දී පොදු මුදල් ඒකකය පිහිටුවන විට ම යුරෝපීය ආර්ථිකයේ පදනම වූ වෛෂයික තත්වයන් වේගයෙන් ඛාදනය වීම ඇරඹී පැවතුනි. මෙම ඛාදනයේ ප්‍රමුඛ සාධක වූයේ ඇමරිකා එක්සත් ජනපදය ලෝකයේ විශාලම නය ගැති රට බවට පත්වීම ද එහි විපාකයක් ලෙස ඩොලරයේ අගය දිගින් දිගට ම පහත වැටීම ද ය. අන්තිමේදී 2008 දී පුපුරා ගිය ඇමරිකා එක්සත් ජනපදයේ රාශිභූත ප්‍රතිසතිතා ඒ වන විටත් බිඳෙනුසුලු බවට පත්ව තිබුනු යුරෝපයේ ආර්ථික හා දේශපාලන සමතුලිතතාවට මරු පහරක් එල්ල කලේ ය. ඩර් ස්පයිගල් සඟරාවට දුන් සම්මුඛ සාකච්ඡාවේ දී ට්‍රිෂේ මහතා තමා යුරෝපය මුහුන දී තිබෙන ආර්ථික අර්බුදයේ ඓතිහාසික ස්වභාවය වටහාගෙන ඇති බව පෙන්නුම් කරයි. එහෙත් ඔහුටවත් යුරෝපයේ ආන්ඩුවල නායකයන්ට වත් පමනක් නොව එක්සත් ජනපදයේ ඔබාමා පාලනාධිකාරයටවත් දරන හරින අර්බුදය කෙසේ විසඳන්නටද යන්න ගැන මොනම අදහසක් හෝ ඇත්තේ නැත. ඔවුනට ඇති එකම විසඳුම වනාහී යුද්ධයට සූදානම් වීමය. ප්‍රථමයෙන්ම කම්කරුවන්ට එරෙහි පන්ති යුද්ධය ය; ඉක්බිති අනිවාර්යයෙන්ම එය හා අත්වැල් බැඳ ගත් ධනේශ්වර බලවතුන් අතර ලෝක යුද්ධය ය. 1991 දී ප්‍රතිගාමී ස්ටැලින්වාදී තන්ත්‍රයන් විසින් සෝවියට් සංගමය විසුරුවා හැරීමට ඉක්බිත්තේ ගෝලීය ධනවාදයේ කථකයෝ වෙලඳපලේ ඓතිහාසික විජයග්‍රහනය ප්‍රකාශයට පත් කලෝය. ඔවුන්ට අනුව නම් 20 වන ශතවර්ශයේ දී ධනවාදයට එරෙහිව කරන ලද අරගල වනාහී ඉතිහාසයේ "සාමාන්‍ය" මාවතින් පිටත්තර කල්තබාම අසාර්ථකත්වය උරුමකොටගත් ඒවා විය. ඉතිහාසය පිලිබඳ මාක්ස්වාදී භෞතිකවාදී සංකල්පය සහ ධනේශ්වර නිෂ්පාදන මාධ්‍යයේ ප්‍රතිසතිතාවන් පිලිබඳ මාක්ස්වාදී විශ්ලේශනය දැන් ඉතින් ඛන්ඩනය කරනු ලැබ ඇතැයි ඔවුහු කියා සිටියාහ.

එහෙත් ලෝක ධනවාදයේ වෛෂයික වර්ධනය විසින් සැබැවින්ම සිදු කර ඇත්තේ පාරට්ටු කරනු ලැබූ එම "ඛන්ඩනය කිරීම්" ම ඛන්ඩනය කර දැමීමයි. මෙම අර්බුදය කොතරම් උග්‍ර තත්වයකට පත්ව ඇත්දැයි කිවහොත්, දැන් මෙම පද්ධතියේ ම ප්‍රමුඛ

කථිකයෝ පසුගිය ශතවර්ෂයේ මිලියන ගනන් ජීවිත බිලිගත් මහා ව්‍යසනයන්ගේ අවතාරය දැකීමට පටන් ගෙන සිටිති.

ගිය සතියේ සිද්ධීන් කම්කරු පන්තියට අනතුරු ඇඟවීමක් හා අභියෝගයක් වේ.

දැන් ලෝක ව්‍යාප්තව දරන හරිමින් පවතින්නා වූ අර්බුදය මානව වර්ගයා මත සිතාගන්නටවත් නොහැකි තරම් අති මහත් විනාශයක් කඩාපාත් කිරීමට තර්ජනය කර සිටී. ධනේශ්වරයේ රාමුව තුල මෙයට මොනම විසඳුමක් හෝ සැලසිය නොහැකිය. මානව වර්ගයාට සියපන රැකගත හැක්කේ ධනවාදය පෙරලා දැමීම හා සමාජවාදය පිහිටුවාලීම උදෙසා දේශපාලන වශයෙන් සවිඥානක වූ කම්කරු පන්තියේ ජාත්‍යන්තර විප්ලවවාදී ව්‍යාපාරයක් වර්ධනය කරගැනීම මගින් පමනි.

ඩේවිඩ් නෝර්ත්

© www.wsws.org